## ශ්‍රී ලංකා විනිශ්වයකාරවරයන්ගේ ආයතනය - 2014

ශ්‍රී ලංකා විනිශ්වයකාරවරයන්ගේ ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1985 අංක 46 දරන ශ්‍රී ලංකා විනිශ්වයකාරවරයන්ගේ ආයතන පනතේ 10(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විනිශ්චයකාරවරයන්ගේ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංරාගිප්‍ර) අනුකූල නොවීම**

ශ්‍රීලංරාගිප්‍ර 1 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම - අස්ථිත්වයක් විසින් වියදම්වල ස්වභාවය හෝ අස්ථිත්වය ඇතුළත ඒවායේ කාර්ය මත පදනම්ව වර්ගීකරණයක් යොදා ගනිමින් විශ්වාසදායී හා වඩාත් අදාළ වන තොරතුරු සැපයෙන වියදම් විශ්ලේෂණයක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ මුහුණත හෝ සටහන්වල හෝ ඉදිරිපත් කළ යුතුය. කෙසේ වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ දැක්වෙන වියදම් ඉහත අවශ්‍යතාවයට එකඟ වී නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ වියදම් වාර්තා කිරීමේදී සංගත ගිණුම්කරණ ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබුණි. එබැවින් එක් එක් කාල පරිච්ඡේදය සඳහා වියදම සැසඳීමට හා ඒ පිළිබඳ අදහස් දැක්වීමට නොහැකි විය.

**2.2.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රේඛීය අමාත්‍යාංශයෙන් ලැබුණු රු.මිලියන 7 ක ප්‍රාග්ධන ප්‍රදානය සාවද්‍ය ලෙස පුනරාවර්තන ආදායම ලෙස ගිණුම් ගත කර තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය හා 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල පිළිවෙලින් එම මුදලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) පෙර වර්ෂ තුනකට අදාළ රු.176,928 ක් වූ විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදම ලෙස සාවද්‍යව ගිණුම් ගත කර තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය සඳහා අතිරික්තය එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

2004 ජනවාරි 26 දිනැති අංක 2004 /පුස්ත / 1 දරන ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩල චක්‍රලේඛයේ 3.1 වගන්තියට අනුව, පුස්තකාල පොත්වලට අදාළ වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකළ යුතු නමුත් එම සමීක්ෂණය සිදුකර නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු.12,827,455 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,131,221 ක් වූ හෙයින් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,696,234 ක වර්ධනයක් දැක්වුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මුළු ආදායම රු.15,692,275 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

සමාලෝචිත වර්ෂය සඳහා කාර්යසාධන වාර්තාවක් විගණනයට ඉදිරිපත් කර තිබුණද, ආයතනයේ අපේක්ෂිත ඉලක්කයන් දක්වමින් සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ආයතනයේ කාර්යසාධනය අපේක්ෂිත ඉලක්කයන් සමඟ සැසඳිය නොහැකි විය.

**4.2 මූල්‍ය කළමනාකරණය**

සමාලෝචිත වර්ෂයේ අවසාන මාස 11 තුළ රු.මිලියන 3 සිට රු.මිලියන 14 ක මුදලක් ආයතනයේ කාර්යයන් සඳහා උපයෝජනය කිරීමෙන් තොරව ආයතනයේ බැංකු ගිණුමේ පැවතුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත හා තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6. පද්ධති හා පාලනයන්**

**---------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ අධ්‍යක්ෂවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) වත්කම් කළමනාකරණය
(ඇ) සැලසුම් කිරීම
(ඈ) මූල්‍ය කළමනාකරණය